᐀

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2446/16 - 2025 ජූලි මස 21 වැනි සඳුදා - 2025.07.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**වන සංරක්ෂණ ආඥාපනත**

1966 අංක 13 (පුනර් මුද්‍රණය), 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත්වලින් සංශෝධිත 1907 අංක 16 දරන (451 අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 3 වගන්තිය යටතේ වූ නියමය.

නියමය

1966 අංක 13 (පුනර් මුද්‍රණය), 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත්වලින් සංශෝධිත 1907 අංක 16 දරන (451 අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 3 වගන්තිය යටතේ පරිසර අමාත්‍ය වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත උපලේඛන අංක 01 සහ 02 හි මායිම් තුළ වූ හෙක්ටයාර් 450.58 ක විශාලත්වයෙන් යුතු රජයේ ඉඩම් 2025 ක් වූ ජූලි මස 15 වැනි දින සිට කන්දෙයාය රක්ෂිත වනාන්තරය ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**දම්මික පටබැඳි,**
පරිසර අමාත්‍ය.

වර්ෂ 2025 ක් වූ ජූලි මස 15 වැනි දින,
ගම්පහ දිස්ත්‍රික්කයේ බජ්ජංගොඩ එළිමහන් රංග පීඨයේ ය.

1A - G 44925 — 34 (2025/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය 01**

ශ්‍රී ලංකාවේ, ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හෙක්ටයාර 235.56 කින් යුක්ත වූ පහත භූමිතික පාඨාංක දැක්වෙන ප්‍රදේශය තුළ පිහිටි රජයේ ඉඩම් ප්‍රමාණය

*උතුරට* : බදුල්ල දිස්ත්‍රික් මායිම සහ භූ.මූ.පි. 70 හි කැබලි අංක 2706, 2558

*නැගෙනහිරට* : භූ.මූ.පි. 70 හි කැබලි අංක 2732

*දකුණට* : අ.භූ.පි. 46 හි කැබලි අංක 679, 694, 692, 693 සහ භූ.මූ.පි. 70 හි කැබලි අංක 2711

*බටහිරට* : අ.භූ.පි. 46 හි කැබලි අංක 696, 691, 697, 698 1/2 සහ 699

**ප්‍රමාණය : හෙක්ටයාර් 235.56**

**උපලේඛනය 02**

ශ්‍රී ලංකාවේ, ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හෙක්ටයාර 215.02 කින් යුක්ත වූ පහත භූමිතික පාඨාංක දැක්වෙන ප්‍රදේශය තුළ පිහිටි රජයේ ඉඩම් ප්‍රමාණය

*උතුරට* : බදුල්ල දිස්ත්‍රික් මායිම

*නැගෙනහිරට* : අ.භූ.පි. 46 හි කැබලි අංක 701, 700 සහ 711

*දකුණට* : අ.භූ.පි. 46 හි කැබලි අංක 701, 712

*බටහිරට* : බදුල්ල දිස්ත්‍රික් මායිම

**ප්‍රමාණය : හෙක්ටයාර් 215.02**


***වන සංරක්ෂණ ආඥාපනත***

*නිවේදනය*

1966 අංක 13 (පුනර් මුද්‍රණය), 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත්වලින් සංශෝධිත 1907 අංක 16 දරන (451 අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 63 වැනි වගන්තිය යටතේ පරිසර අමාත්‍ය වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි ඉහත නියමයෙහි සඳහන් කන්දෙයාය රක්ෂිත වනය වන සංරක්ෂක ජනරාල්ගේ තනි පාලනයට යටත් බවට මෙයින් නිවේදනය කරමි.

**දම්මික පටබැඳි,**
පරිසර අමාත්‍ය.

වර්ෂ 2025 ක් වූ ජූලි මස 15 වැනි දින,
ගම්පහ දිස්ත්‍රික්කයේ බජ්ජංගොඩ එළිමහන් රංග පීඨයේ ය.


Declaration of Kandeyaya Reserve Forest
Legend
District
Moneragala
DS Division
Wellawaya
Area (ha)

EOG 07 - 0270